# කොවිඩ් - 19 - සති පාසල - සබරමු පළාත

## 9 ශ්‍රේණිය - ඉතිහාසය

## ඒකකය 3 - ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික පුනර්ජීවනය

## පැවරුම් අංක 2

ක්‍රියාකාරකම් :- අංක - 2 ශ්‍රී ලංකාවේ ඇති වූ පුනර්ජීවනය හඳුනා ගනිමු.

හැඳින්වීම :- බ්‍රිතාන්‍ය පාලන සමයේ ඇති වූ මිෂනාරී ව්‍යාපාරයත් සමග තම රට ස්වදේශීය ආගම හා සංස්කෘතීන් තර්ජනයට ලක්විය.එහිදී ස්වදේශීය ආගමික නායකයින් තම ආගම හා සංස්කෘතිය රැකගැනීමට මිෂනාරි වරුන්ට විරුද්ධව ක්‍රියා කල අතර එම සිදුවීම බෞද්ධාගම තුළද සිදු විය.එය බෞද්ධ පුනර්ජීවනය ලෙස හැඳින්වේ
...........................................................................................................................

- ගුණාත්මක යෙදවුම් :- ඉතිහාසය පෙළපොත/ඉතිහාසය සටහන් පොත/පෑන් පැන්සල්
- ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස් :-
  පියවර - 1 :- 9 ශ්‍රේණිය පෙළපොතේ පිටු අංක 57 – 64 දක්වා කියවන්න.
  පියවර - 2 :- ඉතිහාසය සටහන් පොත ගෙන පැවරුම් අංක 1 ප්‍රශ්නාවලිය අවසන් වූ තැනින් පහතින් සපයා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.(පිළිතුර ,ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය ලිවීම අනිවාර්ය වේ)
- පිළිතුර ලිවීමට පෙළපොතේ 57 සිට 64 දක්වා උපකාර කරගන්න.

ප්‍රශ්නාවලිය :-

**1.මෙරට ආගමික පුනර්ජීවනයට නායකත්වය ගත් ගිහි /පැවිදි නායකයින් දක්වන්න.**

**2.බෞද්ධ පුනර්ජීවනයට ගන්නා ලද ක්‍රියාමාර්ග ලියා දක්වන්න.(බෞද්ධ පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ)**

**3.බෞද්ධ පුනරුදය තුළ ඇති වූ නව පිරිවෙන් හා ඒවාට නායකත්වය ගත් පිරිස් ලියා දක්වන්න.**

**4.ලංකාවේ ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය හා එය පිහිටුවීමට මූලිකත්වය ගත් පිරිස් ලියා දක්වන්න.**

**5.බෞද්ධ පුනරුදය තුළ එළි දැක්වූ බෞද්ධ ප්‍රකාශන ලියා දක්වන්න.**

**6.වාද විවාද සඳහා නායකත්වය ගත්තේ කවුරුන්ද?ඒ සඳහා සහභාගී පිරිස් ලියා දක්වන්න.**

**7.පංච මහා වාදයන් ලියා දක්වන්න.එහි ප්‍රතිඵලයක් ලෙස මෙරටට පැමිණි විදේශකයන් කවුරුන්ද?**

**8.ලංකාවේ බෞද්ධ පාසල් පිහිටුවීමට මූලිකත්වය ගත් පිරිස් දක්වා පිහිට වූ බෞද්ධ පාසල් ලියා දක්වන්න.**

පසු වැඩ:- *** "මිෂනාරී ව්‍යාපාරයට විරුද්ධව නැගී ආ මෙරට බෞද්ධ පුනරුදය " පුනරුදය යනු මාතෘකාව යටතේ රචනයක් ලියන්න.(බෞද්ධ පුනරුදයට ගත් ක්‍රියාමාර්ග විස්තර කර දැක්විය යුතුය.)**

- **පහතින් නම් සඳහන් බෞද්ධාගමික නායකයින් පිලිබඳ පොත් පිංචක් නිර්මාණය කරන්න.**

**1.පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි** **2.පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි**

**3.හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා** **4.අනගාරික ධර්මපාල තුමා**

**පාසල ආරම්භ වූ පසු මෙම රචනා හා පොත් පිංච තම ඉතිහාසය ගුරු භවතාට ලබා දීමට කටයුතු කරන්න.**

# කොවිඩ් - 19 - සති පාසල - සබරමු පළාත

# 9 ශ්‍රේනිය - භූගෝල විද්‍යාව

# 2 සතිය

# 2 පාඩම - ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

<u>**ක්‍රියාකාරකම් 1**</u>

1.ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය සමන්විත දෑ කවරේද?

2.ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන උස මට්ටම ද සහිතව දක්වන්න.

3.ශ්‍රී ලංකාවේ වෙරළ බඩ තැනිතලාවට අයත් භූ විෂමතා ලක්ෂණ ඇසුරින් ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| වෙරළබඩ භූ විෂමතා ලක්ෂණ | හඳුනාගත හැකි ප්‍රදේශ |
|---|---|
| උදා:- කලපු | පුත්තලම කලපුව,යාපන කලපුව |
| | |
| | |
| | |

4.ශ්‍රී ලංකා අකෘති සිතියමක පහත වෙරළබඩ ලක්ෂණ ලකුණු කර නම් කරන්න.

**ත්‍රිකුණාමලය,මන්නාරම් දූපත,පේදුරු තුඩුව,පුත්තලම කලපුව,කොඩ්ඩියාර් බොක්ක,මඩකලපුව,වැලි ගම බොක්ක**

<u>**ක්‍රියාකරකම් 2:-**</u>

1.අභ්‍යන්තර තැනි තලාවට අයත් ප්‍රධාන භූ විෂමතා ලක්ෂණ උදාහරණ සහිතව දක්වන්න.

2.ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව හඳුනාගත හැකි ප්‍රධාන භූ විෂමතා ලක්ෂණ කවරේද?ඒවා උදාහරණ දෙක බැගින් ලියන්න.

3.පහත සඳහන් බූ විෂමතා ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න.

- කඳු වැටිය
- සානුව
- කපොල්ල

4.මධ්‍යම කඳුකරය දැක්වෙන සිතියමක් පිටපත් කර ගෙන එහි ප්‍රධාන විෂමතා ලකෂණ ලකුණු කර නම් කරන්න.(මේ සඳහා පෙළ පොත් 2 .2 සිතියම යොදා ගන්න)

# කොවිඩ් - 19 - සති පාසල - සබරමු පළාත

# නිවිතිගල අධ්‍යාපන කලාපය

# 9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

<u>ප්‍රජාතන්ත්‍රවාදී පාලනය</u>

<u>ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප</u>

- පළමු සතියේදී ඔබ ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්දැයි හඳුනාගනු ලැබීය.එම ප්‍රජාතන්ත්‍රවාදය ලෝකයේ ආකාර දෙකකින් ක්‍රියාත්මක වේ.එය ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප ලෙස හැඳින්වේ.

- ඔබ පෙළපොතේ 68 – 72 දක්වා පිටු හොඳින් අධ්‍යනය කරන්න. එහිදි තව දුරටත් මෙය පැහැදිලි වේ.ඒ ඇසුරින් පහත සඳහන් පැවරුමට පිළිතුරු සපයන්න.

<u>පැවරුම</u>

1.

i. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද?
ii. එය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමට අපහසු වීමට හේතු මොනවාද?
iii. එහි පාලන කටයුතු වලට සහබාගී විය නොහැකි පිරිස් වූයේ කවුද?
iv. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ කුමක්ද?
v. ලෝකයේ දැනට සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ බහුල රටක් ඇත.ඒ.කුමක්ද?

2.

i. වක්‍ර හෙවත් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද?
ii. මෙහි නියෝජිතයින් තෝරා ගනු ලබන ක්‍රමය හඳුන්වන නම කුමක්ද?
iii. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් 5 ක් ලියන්න.
iv. රටක ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක වීම කෙරෙහි බලපාන සාධක 5 ක් ලියන්න.
v. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ 10 ක් ලියන්න.